# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2018 ජනවාරි මස 23 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**1. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;** (ප්‍ර/ VI (1) / 18 /01)

අ) අවිස්සාවේල්ල මූලික රෝහලට අයිති ගොඩනැගිලි කිහිපයක් රෝහල් කාර්යය මණ්ඩලයට අයත් නොවන පුද්ගලයින් විසින් පරිහරණය කරන බව ඔබතුමා දන්නේද?

ආ) රෝහල් සේවයේ නියුතු විවිධ ශ්‍රේණි වලට අයත් බහුතර පිරිසක් නිල නිවාස නොමැතිව පෞද්ගලික ස්ථාන වල පදිංචිව සිට, රෝහලට සේවය සඳහා පැමිණෙන බව ඔබතුමා පිළිගන්නේද?

ඇ) රෝහල සතු ගොඩනැගිලි බාහිර අයගේ පදිංචියට දීමෙන්, වරප්‍රසාද ලැබිය යුතු නිලධාරීන් හා විවිධ සේවාවන් වල නියුතු අයට, අසාධාරණයක් වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ඈ) මේ පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව;

"අද දින [2018.01.23 වන දින] විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව, 2018.02.20 දින පෙ.ව. 9.30 ට රැස්විය යුතු අතර, 2018.02.06 වන (අඟහරුවාදා) දිනය, සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."

## X. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව;

"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මන්ත්‍රීතුමා;

" ශ්‍රී ලංකාව තුල විවෘත ආර්ථික වෙළඳපොළ හඳුන්වාදීමත් සමඟ පරිභෝජනවාදය සීඝ්‍රයෙන් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස බැහැර කරන කැලිකසළ ප්‍රමාණය සීඝ්‍රයෙන් ඉහළ ගියේය. එසේ බැහැර කරන කැලිකසල වල දිරාපත් නොවන ලන්ච් ෂීට්, සිලි බෑග්, රෙජිෆෝම්, පොලිතීන් විශාල වශයෙන් එක් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දිරාපත් වන කසළ දිරාපත්වීම ප්‍රමාදවීමට මෙය හේතු වූ අතර, පරිසරයටත්, සමාජයටත්, මානව පැවැත්මටත් වෙනත් සත්ත්ව කොටස් වලටත් බහුවිධ බලපෑමක් එක්කළ අතර, දිරාපත් නොවී කුණු කඳු ගොඩගැසීම නිසා විශාල ඛේදවාචකයක් සහ ජීවිත හානි ද සිදුවිය.

කසළ බැහැර කිරීමට, දිරාපත්වීමට, ප්‍රතිචක්‍රීකරණයට හා කොම්පෝස්ට් නිෂ්පාදනයට ලන්ච්ෂීට්, සිලිබෑග්, රෙජිෆෝම්, පොලිතීන් විශාල ප්‍රමාදයක් හා බාධකයක්, ව්‍යසනයක්, ඇති කරන බැවින් ඒවා නිෂ්පාදන කිරීම, විකිණීම හා භාවිතය, තහනම් කරමින් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය ගනු ලැබූ තීරණය රටේ අනාගතය, අනාගත පරපුර හා පරිසරය සම්බන්ධ ඵලදායි ප්‍රතිපත්ති තීරණයක් ලෙස පෑසසුමට හා අගය කිරීමට ලක්කරන අතර රට වෙනුවෙන් මෙම පොලිතීන් තහනම ක්‍රියාත්මක කිරීමටත් ඊට අදාල නීතිය ක්‍රියාත්මක කිරීමටත්, බස්නාහිර පළාත් සභාවේ සභය පළ කළ යුතු යැයි යෝජනා කරමින්, මෙම ප්‍රතිපත්ති කවර බලපෑමක් නිසාවත් ආපසසට නොහැරවිය යුතු යැයිද, පරිසර හිතකාමී විකල්ප ආදේශන ප්‍රවර්ධනය කිරීමටත්, ජනගත කිරීමටත් කඩිනමින් කටයුතු කළ යුතු යැයිද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."

[යෝ/VI(1)/17/09]

**02.** ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කල යුතුයැයි මෙරට වාමාංශික දේශපාලන පක්ෂ මෙන්ම දක්ෂිණාංශික දේශපාලන පක්ෂද ඇඩිව කථිකා කරන ලද අතර, විධායක ජනාධිපතිධුරය වහා අහෝසි කළ යුතු බවට බරපතල උද්ඝෝෂන පවා රට තුළ ක්‍රියාත්මක විය. මේ තත්ත්වය යටතේ රටට ගැලපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සෑදීමටත්, ජනාධිපතිධුරය සතු වූ අසීමාන්තික විධායක බලය පාර්ලිමේන්තුවට පැවරීමටත්, පසුගිය මැතිවරණ වලදී පොරොන්දු දෙනු ලැබීය. විධායක බලය අහෝසි කරන බවට පොරොන්දු වූ හිටපු ජනපතිවරුන් කිසිවෙක් එය එසේ ඉටු නොකලද, වර්තමාන ජනාධිපතිතුමා, දිගින් දිගටම බලයේ රැඳී සිටීමට හැකි වන ලෙස පනවා තිබූ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම, යම් සාධනීය ලක්ෂණයකි. වර්තමාන ජනාධිපතිතුමා සහ අගමැතිතුමා ද, ජනතාව හමුවේ පොරොන්දු වූ පරිදි, සියලු පක්ෂ ඒකරාශී කර ගෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒමට හරවත් සංවාදයක් ඇති කරන මේ මොහොතේ, පටු දේශපාලන ආකල්ප ඉවත ලා, මෙරටට ගැලපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්, නිර්මාණය කර ගැනීමට, සියළුම ජනතාව ඒකරාශී කර ගත යුතුයැයි, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, රජයට යෝජනා කර සිටියි."

(යෝ/ VI (1) / 17 /10)

## XII. පොදු කටයුතු

**01.** ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප):

"බස්නාහිර පළාතේ 2017 අංක ------------- දරණ බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය."

(දෙවන වර කියැවීම)

(පළමුවර කියැවීම 2017.08.22 දින සිදු කර ඇත.)

ඇමුණුම 01 - ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා වාර්තාව - 2017.12.07 දින

ඇමුණුම 02 - ප්‍රඥප්ති කෙටුම්පත

## XIII. සභාව කල් තැබීම

2018.01.10 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව